# 2022 ශිෂ්‍යත්වය

# පරිසරය කෙටි ප්‍රශ්න 1000

කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපය

## 10 ඒකකය

# ගෙවත්ත

පිළිතුරු 3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකි ය.



සැකසුම :-

හසිත හෙට්ටිආරච්චි

Dip. In Sci. N.I.E./O.U.S.L.

Online Class details –WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube

කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| කාර්ය පත්‍රිකාව | 5 ශ්‍රේණිය | 10. ගෙවත්ත |
|---|---|---|

සැකසුම :- කේ. සී. ගුණතිලක
අ/ අඟුනෝච්චිය විද්‍යාලය

ප්‍රාථමික අංශය
කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපය

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. පලතුරු වගාවට බෙහෙවින් හානිකරන සතෙකු වන්නේ
   1. කැරපොත්තා 2. පිටි මකුණා 3. දළඹුවා 4. මකුළුවා

2. බෝග වගා කිරීමේ විකල්ප ක්‍රම යොදා ගැනීමේ ඇති වාසියක් නොවන්නේ,
   1. පහසුවෙන් සාත්තු සප්පායම් කළ හැකි වීමයි.
   2. අව්වැසි ආදියෙන් ආරක්ෂා කර ගැනීමට හැකි වීමයි.
   3. අවශ්‍ය විට එහා මෙහා කළ හැකි වීමයි.
   4. ඉඩකඩ ඇති තැන්වල පමණක් වගා කළ හැකි වීමයි.

3. ගෙවත්තේ බෝග වගාවට හානි කරනු ලබන කෘමි පැමිණීම වලක්වාලීමට වගා කරන ශාකයක් වන්නේ,
   1. මදුරුතලා ය. 2. ගඳපාන ය. 3. පැගිරි ය. 4. දාස්පෙතියා ය.

4. අතු කැබලි සිටුවීමෙන් පැළ ලබාගත හැකි බෝග වර්ගය කුමක් ද?
   1. මිරිස් 2. මෑ 3. කංකුං 4. අර්තාපල්

5. ගෙවතු වගාවේ දි භාවිත කෙරෙන උපකරණ පමණක් ඇති පිළිතුර තෝරන්න.
   1. උදැල්ල, මුල්ලුව හා ලඹය 2. මයිනහම, නගුල හා රේක්කය
   3. යතු කැටය, උදැල්ල හා රේක්කය 4. උදැල්ල, මුල්ලුව හා රේක්කය

6. පස සාරවත් කිරීමට උදව් කරන සතෙකු වන්නේ,
   1. පත්තෑයා ය. 2. කුඩිත්තා ය. 3. ගැඩවිලා ය. 4. හැකරැල්ලා ය.

7. බෝග වගාවේ දි ගොවියාට උපකාරවත් වන සතෙකු වන්නේ,
   1. මී මැස්සා ය. 2. කුඩිත්තා ය. 3. ගෙමැස්සා ය. 4. ගොළුබෙල්ලා

8. වගාවට හානි කරන සත්ත්ව විශේෂයක් නොවන්නේ,
   1. පැලමැක්කා ය. 2. කුඩිත්තා ය. 3. පුරුක්පණුවා ය. 4. ගෙම්බා ය.

9. රෝපණය කිරීමට සුදුසු බීජයක ලක්ෂණයක් වන්නේ,
   1. නොමේරූ බීජයක් වීම ය. 2. පිට පොත්ත පැල්ලම් රහිතව දීප්තිමත් වීම ය.
   3. තුවාල වීම ය. 4. බීජ අව පැහැ වීම ය.


10. තවාන් කර පැළ ලබා ගැනෙන බෝග වර්ගයකි.
    1. බතල 2. කංකුං 3. මිරිස් 4.පතෝල

11. පරිසර හිතකාමී කෘමිනාශකයක් සකස්කර ගැනීම සඳහා වඩාත් යෝග්‍ය වූ බීජ වර්ගයකි.
    1. ගස්ලබු ඇට 2. කොහොඹ ඇට 3. එඬරු ඇට 4. දඹල ඇට

12. කරල් හට ගන්නා ගසකි.
    1. මෑ 2. දඹල 3. බණ්ඩක්කා 4. බෝංචි

13. කොම්පෝස්ට් පොහොර සෑදීමට යොදා ගත හැකි ද්‍රව්‍ය කි.
1. පොලිතීන් 2. කොළ රොඩු 3. ටින් 4. වීදුරු කැබලි

14. ඉවත දමන භාජනයක් බෝග වගාවට යොදා ගෙන ඇති ආකාරය රූපයේ දැක් වේ. මෙම විකල්ප ක්‍රමය පිළිබඳව පහත සඳහන් කුමක් නිවැරදි ද?



1. සාත්තු කිරීමට අපහසු ය.
2. එකම ස්ථානයක තබා වගා කල යුතු ය.
3. සත්තුන්ගෙන් ආරක්ෂා කර ගැනීම අපහසු ය.
4. ඉඩකඩ සීමා වු තැන්වල බෝගවලට සුදුසු ය.

15. තවාන් පැළ ලබාගෙන පාත්තිවල සිටුවනු ලබන බෝග වර්ග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. බෝංචි, බණ්ඩක්කා, නිවිතිය 2. බෝංචි, තක්කාලි, මාළු මිරිස්
3. වම්බටු, නිවිතිය, තක්කාලි 4. මාළුමිරිස්, වම්බටු, තක්කාලි

16. බීජයක් පැළවීමේ දි මුලින් ම දක්නට ලැබෙන්නේ,
1. මුල 2. පත්‍ර 3. කඳ 4. දල්ල

17. පාසල් වත්තේ මිරිස් පාත්තියක් සකස් කිරීමට තෝරාගත යුත්තේ
1. හිරු එළිය අඩුවෙන් ලැබෙන විශාල ගස් ඇති බොරළු සහිත බිමකි.
2. බොරළු සහිත ජලය බැස යන තැනිතලා බිමකි.
3. හිරු එළිය හොඳින් ලැබෙන ජලය බැස යන බොරළු රහිත තැනිතලා බිමකි.
4. හිරු එළිය ඉතා අඩුවෙන් ලැබෙන විශාල ගස් ඇති බොරළු රහිත තැනිතලා බිමකි.

18. කාබනික පොහොර වර්ගයක් නොවන්නේ,
1. එළු පොහොර 2. ගොම 3. යූරියා 4. කොළ රොඩු

19. ඉක්මනින් පැළවෙන බීජ කාණ්ඩය ඇතුළත් පිළිතුර තෝරන්න.
1. මිරිස්, අබ, මුං 2. මිරිස්, අඹ, කුඩළු
3. මුං, පුවක්, දාස්පෙතියා 4. පොල්, තක්කාලි

20. හේන් ගොවියා අස්වැන්න නෙලාගත් පසු දෙනු ලබන දානයක් වනුයේ.
1. දේව දානය 2. උපාසක දානය
3. බලු කපුටු දානය 4. මතක දානය

21. ගෙවත්තක දක්නට ලැබෙන අංගයක් නොවන්නේ
1. මල් පාත්ති 2. ගේට්ටුව 3. දඬුවැට 4. කාණු පද්ධතිය

22. ගෙවත්තක වල් පැළ ඉවත් කිරීමට යොදා ගන්නා ක්‍රමයක් නොවන්නේ
1. අතින් ගලවා දැමීම 2. වීසි ගැසීම 3. අතු ගෑම 4. උදළු ගෑම

23. පාත්තිවල සිටුවන බෝග පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.
1. මිරිස්, බණ්ඩක්කා, බටු 2. බණ්ඩක්කා, මෑ , වැටකොළු
3. මිරිස් , බටු , තක්කාලි 4. දඹල, තක්කාලි , කරවිල

24. බෝග වගාවට හානි නොකරන සතුන් ඇතුලත් පිළිතුර තෝරන්න.
1. බත්කූරා, පළගැටියා 2. බකමූණා, ගොළුබෙල්ලා
3. සමනළයා, මී මැස්සා 4. ගැඩවිලා, දළඹුවා

25. වගා බඳුනකට සමාන ප්‍රමාණයෙන් යොදා ගත යුතු දේ වනුයේ
   1. ගඩොල් කැබලි ,වැලි ,මතුපිට පස්
   2. කාබනික පොහොර, වැලි ,මතුපිට පස්
   3. පොල් ලෙලි ,ගඩොල් කැබලි ,වැලි
   4. පොල් ලෙලි, මතුපිට පස්, වැලි

26. ගෙවතු වගාවේ දී අස්වැන්න නාස්ති වන ආකාරය නොවන්නේ
   1. සතුන්ගෙන් හානි සිදුවීම.
   2. අධික වැස්ස ලැබීම.
   3. නියගය ඇති වීම
   4. නියමිත කාලයට අස්වැන්න නෙලා ගැනිම.

27. 3R සංකල්පයට අයත් කරුණක් නොවන්නේ
   1. ප්‍රතිචක්‍රීකරණය
   2. ජීවානුහරණය
   3. භාවිතය අවම කිරිම.
   4. නැවත භාවිතා කිරිම.

28. රූපයේ දැක්වෙන බෝතලයේ පතුල ඉවත් කර සාදාගත් වගා බඳුනේ සිටුවා ඇති කුඩලු පැලයේ අතු ඉහලට නැවෙන්න හේතුව කුමක් විය හැකි ද?



   1. හිරු එළිය ලබා ගැනිමට
   2. වාතය ලබා ගැනිමට
   3. අලංකාරයට
   4. ජලය ලබා ගැනිමට

29. ගෙවත්තේ වගා කරන පලා වර්ගයක් නොවන්නේ.
   1. ගොටුකොළ
   2. කංකුං
   3. තම්පලා
   4. පුහුල්

30. කාබනික පොහොර යෙදිමෙන් ඇති වාසියක් වනුයේ
   1. රෝග වලට ගොදුරු වීම.
   2. විෂ රහිත ආහාර ගැනිමට හැකි විම.
   3. පෝෂණ ගුණයෙන් අඩු ආහාර ලැබීම.
   4. රසයෙන් අඩු ආහාර ලැබීම.

31. සතුන්ට හානි නොකර සතුන්ගෙන් වගාවට සිදුවන හානිය වලක්වා ගැනිමට ගෙවත්තේ රදවන උපකරණයක් වනුයේ
   1. උගුල
   2. කැටපොලය
   3. සුළංටකය
   4. දඬුවැට

32. වගා බිමක් සැකසීමෙ දී කුණු එකතු කිරිමට යොදා ගන්නා උපකරණයකි.
   1. අලවංගුව
   2. මුල්ලුව
   3. උදැල්ල
   4. රේක්කය

33. බෝග වගාවට අහිතකර සතෙකු වන්නේ.
   1. ඉත්තෑවා
   2. සමනලයා
   3. බඹරා
   4. ගෙම්බා

34. හිරු එළිය අඩුවෙන් අවශ්‍ය ශාකයකි.
   1. බටු
   2. දාස්පෙතියා
   3. ඇන්තුරියම්
   4. කෝමාරිකා

35. එළවළු එකින් එක නොගැටෙන ලෙස නොතැලෙන ලෙස තැබිමෙන් සිදුවන දෙය තෝරන්න.
   1. කුණු වීම
   2. මේරීම
   3. ඉදීම
   4. ආරක්ෂා වීම.


36. හේනේ වගා කරන බෝගයක් නොවන්නේ.
   1. කුරහන්
   2. ඉරිඟු
   3. මෙනේරි
   4. තල්

37. අතීතයේ දී ගෙවතු වගාවේ ආරක්ෂාව සඳහා යොදා ගත් සම්ප්‍රදායික ක්‍රමයක් නොවන්නේ.
1. වගාවන් සඳහා අළු යෙදීම.  2. පඹයන් සිටුවීම
3. දැල් ආවරණ යෙදීම  4. ටකය ගැට ගැසීම

**38. "උණ දඬු කපන තැන උණදඬු රිකිල්ලා**
**බට දඬු කපන තැන බටදඬු රිකිල්ලා"** යන ජන කවිය ගායනය කරනු ලබන්නේ,
1. කුරහන් කපන විට  2. පන් නෙලන විට
3. පැල් රකින විට  4. ගොයම් කපන විට

39. බෝග වගාවේ දි මල්වලට හානි කරන සතෙකු වන්නේ
1. කටුස්සා  2. කුරුමිණියා  3. පුරුක් පණුවා  4. බඹරා

40. රූප සටහනේ දැක්වෙන ආකාරය මුං බීජ දමා දින කීපයකට පසු බැලූ විට බීජ පැළ නොවීමට බල පෑ හේතුව කුමක්ද?




1. ආලෝකය නොලැබීම
2. වාතය නොලැබීම
3. ජලය නොලැබී
4. පොහොර නොලැබීම.

41. ඉවතලන දෙය ප්‍රතිචක්‍රීකරණය කර වගා බඳුනක් සාදාගත හැකි දෙයක් වනුයේ.
1. ලී  2. ප්ලාස්ටික්  3. පන්  4. උණ බට

42. අතීතයේ හේන් වගාවේ යෙදුණ ගොවියා අස්වැන්න ආරක්ෂා කර ගැනීමට නොකළ දෙයක් වනුයේ,
1. අද්දර තැලීම  2. පිරිත් පැන් ඉසීම  3. වෙඩි දැමීම  4. පටි බැඳීම

43. "මොනවද මුත්තේ මොකද කරන්නේ" ගීතයෙන් ගෙවතු වගාව ගැන කියවේ. එම ගීතයේ රචකයා කවුද?
1. රෝහණ වීරසිංහ ය.  2. ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි.
3. අනුෂා නානායක්කාර ය.  4. නන්දා මාලනි ය.

44. ක්‍රමවත් ගෙවත්තක් පවත්වා ගැනිමෙන් ලැබෙන වාසියක් නොවන්නේ.
1. ප්‍රයෝජන ගැනිමේ දි වඩා පහසු බව ඇතිවිම.
2. ගෙවත්ත වඩා සුන්දර ස්ථානයක් වීම.
3. සිතට සැනසිමක් ඇති විම.
4. පස සෝදා යෑම.

45. ඖෂධ පැළෑටියක් ලෙස ගෙවත්තේ වවන ශාකය තෝරන්න.
1. දාස්පෙතියා  2. තම්පලා  3. ඉඟුරු  4. කපුරු

46. කැලේ කපා ගිනි තබා අලුතෙන් සකස් කර ගන්නා හේන හඳුන්වන්නේ.
1. කනතු හේන  2. වගාහේන  3. අලුත් හේන  4. නවදැලිහේන

47. දඬු කැබලි සිටුවා පැලයක් ලබා ගත නොහැකි බෝග වර්ග කුමක් ද?.
1. බතල  2. කංකුං  3. මඤ්ඤොක්කා  4. දඹල

48. මේරීමට පෙර නෙලා ගත යුතු එළවළු වර්ගය තෝරන්න.

1. වට්ටක්කා  2. බණ්ඩක්කා  3. කැකිරි  4. කරවිල

49. තවාන් දැමීමට සුදුසු බීජ ඇතුළත් පිළිතුර තෝරන්න.

1. මිරිස්, අලිගැටපේර, වී  2. මිරිස්, දාස්පෙතියා, වම්බටු

3. අඹ, මිරිස්, කුඩලු

50.




A  B  C  D

රූපවල දක්වා ඇති බීජ සහිත බඳුන් දින කීපයක් නිරීක්ෂණය කල විට ඉක්මනින් බීජ පැළ වී ඇති බව දක්නට ලැබෙන්නේ කුමන භාජනයේ ද?

1. A  2. B  3. C  4. D

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ